## 12. ශීර්ෂ 10 - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව

---

### 12.1 විසර්ජන ගිණුම

---

**අයවැය විචලනය**

---

වැය විෂයන් 8 ක් සඳහා එකතුව රු.2,683,162 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ත් සියයට 67ත් අතර පරාසයක පැවතුණි.

### 12.2 අග්‍රිම ගිණුම

---

කොමිෂන් සභා කාර්යාලයේ තත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරිම හා පියවිම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) තත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරිමට ප්‍රථමයෙන් කාර්යයට අදාල වියදම් ඇස්තමේන්තු කර එම ඇස්තමේන්තුවේ නිවැරදිභාවය පිළිබඳ තහවුරු වු පසු අතුරු අග්‍රිම නිකුත් කළ යුතුව තිබුණි. එසේ අනුමත ඇස්තමේන්තු ලබා නොගෙන අවස්ථා 09 කදී එකතුව රු.108,000 ක අතුරු අග්‍රිම නිකුත් කර තිබුණු අතර ඉන් එකතුව රු.41,044 ක් වැය කළ පසු එකතුව රු.66,956 ක් ඉතිරි වි තිබුණි. ඇස්තමේන්තු මත අතුරු අග්‍රිමයන් නිකුත් නොකිරිම නිසා රජයේ මුදල් වෙනත් පාර්ශවයන් අත රඳවා ගැනිමට මෙමගින් අවස්ථාව ලැබි තිබුණි.

(ආ) කොමිෂන් සභාවේ කාර්යාලයේ වාහන සේවා කිරිම අදාල වාහන ඒජන්තවරුන් මගින් සෘජුවම ඉටු කර ගත හැකි වුවත්, එසේ නොකර ඒ සඳහාද තත් කාර්ය අතුරු අග්‍රිමයන් නිකුත් කර තිබුණි. නියැදි විගණන පරික්ෂාවකදි අවස්ථා 05 කදී වාහන සේවා කිරිම සඳහා එකතුව රු.95,000 ක අතුරු අග්‍රිම නිකුත් කර තිබුණු අතර ඉන් රු.57,806 ක් වැය කර තිබුණි. ඒ අනුව එකතුව රු.37,194 ක් වැඩිපුර නිකුත් කර තිබුණි.

(ඇ) අවස්ථා 18 කදී එකතුව රු.285,940 ක තත් කාර්ය අතුරු අග්‍රිමයන් නිකුත් කර තිබුණු අතර, අදාල නිලධාරින් එම මුළු අතුරු අග්‍රිමය දින 03 සිට දින 18 දක්වා කාල පරාසයක් අත රඳවාගෙන පසුව මුළු මුදලම මුදලින් නිරවුල් කර තිබුණි.

### 12.3 අල්ලස් වැටලීම් අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2014 දෙසැම්බර් 31 දිනට නඩු භාණ්ඩ භාර නිලධාරියාගේ ලේඛන අනුව අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.15,502,902 ක් වුවද, අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට ශේෂය රු.15,719,482 ක් වුයෙන් රු.216,580 ක වෙනසක් පැවැතුණි. වර්ෂ 4 ක සිට වර්ෂ 30 ක් දක්වා පැරණි නඩු භාණ්ඩවල වටිනාකම වු රු.5,203,402 ට අදාල ඇතැම් භාණ්ඩවලට මුදල් නිදහස් කර ගැනීමට අධිකරණයට මෝසම් ඉදිරිපත් කර ඇති බව 2012 වැටලීම් අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් නිකුත් කළ විගණන විමසුමට 2013 සැප්තැම්බර් 24 දින ඉදිරිපත් කරන ලද පිළිතුරේ දක්වා තිබුණත්, එම ශේෂයයන් 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් නොකර පැවතුණි.

## 12.4 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

සමාලෝචිත වර්ෂයේදි කොමිෂන් සභාවේ වාහන 6 කට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාර ප්‍රාරම්භක වාර්තා හා පූර්ණ වාර්තා 2015 මැයි 28 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 12.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 20 | 14 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 01 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 60 | 57 | 03 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 66 | 60 | 06 |
| | **එකතුව** | **165** | **138** | **27** |